මේ අප ලැබූ මිනිස් ජීවිතයේ අප මෙලොවට ගෙන ආ වටිනාම සම්පතයි මනුස්සකම. දිනෙන් දින තරුණ වියට එළැඹෙමින් වියපත් වෙද්දී අප උපතේ දී මිට මොළවාගෙන ආ මිනිස්කම්වලට කුමක් වෙයිද ?

නිසා දෝ ළමා ගීත නිර්මාණය කරන්නත්, ළමා වැඩසටහන් ඉදිරිපත් කරන්නත් තමයි වැඩියෙන් යොමු වුණේ. සිසිර කොතලාවලත් එක්ක ''ගායනා'' කියල වැඩසටහනක් කළා. ළමයින් වෙනුවෙන්."

වගේ ම අපටත් ඒක හරි සතුටක්.

# කරුමේ කිමද වඳ වෙන ඉර සදිසි මිනිස්සු




එහෙත් හැකි පමණින් තමන්ගේ ගුණ යහපත් වඩවාගනිමින් අප අතර සිටිනා සුන්දර මිනිසුන් නැතිවා නොවේ. අපගේ අවධානයට යොමු විය යුතු කාරණය වන්නේ එවන් මිනිසුන් දිනෙන් දින වඳ වී යන්නේ කිමද යන කාරණයයි. මේ අදහස් අනුව ලියැවුණ ඉතා අගනා පද පෙළක් තෝරාගෙන ගැයූ ලක්ෂ්මන් විජේසේකර ගායන ශිලපියාණන් එවන් සුන්දර කලාකරුවෙක්. විජේසේකරයන් ගායන ශිල්පියෙකු ලෙස ගුවන් විදුලියේ සරළ




ගී පරීක්ෂණයෙන් සමත්ව සුදුසුකම් ලබන්නේ 1975 වසරේදී. ගායනයට අමතරව වෙළඳ

ඒ වැඩසටහනට මම අවුරුද්දක් දෙකක්ම දායක වුණ ළමයින්ට සතියකට සැරයක් අළුත් ගීතයක් උගන්වන වැඩ සටහනක් ඒක. ඒ නිසා ළමා ගීත එකතුවක් නිර්මාණය කෙරුණා. දැන් ඒ වගේ වැඩසටහන් වෙනුවෙන් අනුග්‍රාහකයින්ව සොයා ගන්න තියෙන අපහසුකම් නිසා ඒවා කෙරෙන්නේ නෑ. ඒක කණගාටුවට කාරණයක්.

ලක්ෂ්මන් විජේසේකරයන් ''ගායනා'' නමින් ළමා ගී සංගත තැටියකුත් ''මුතු අහුරක්'' නමින් ළමා ගී පොතකුත් එළිදැක්වූ බව

''ඒ වගේ ම අපිව මෙහේ මේ වාරේ ගෙන්වාගෙන අපට සළකමින් ප්‍රසංගය සංවිධානය කරපු ලීල් බටුගෙදර මහත්මයාටත් ඒ මහත්මියටත් විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙන්න ඕන.'' නිහතමානී කමින් නැහැවුණ සුන්දර සිනාවකින් ලක්ෂ්මන් විජේසේකර අපගේ පිළිසඳරට නැවතුම් තිත තැබුවා. වැඩි කතා බහක් නැති නිහඬ කලා කරුවෙකි විජේසේකර.

ප්‍රසංගය වෙනුවෙන් වෙහෙසෙමින් ඉතා කාර්ය බහුල අවස්ථාවක සිටිය ද ''සන්නස'' පාඨකියින් වෙනුවෙන් ලක්ෂ්මන් විජේසේකරයන් සමග පිළිසඳරක යෙදීමට ඉඩ හසර ලබා දුන් ලීල් නිශාන්ත බටුගෙදර සොයුරාටත් ප්‍රිය බිරිඳටත් අපිදු ස්තුතිවන්නෙමු.

''විලම්බිත'', ''දඟයින්ට පමණයි'', ''ටිකිරි සහ උංගි'' වැනි ළමයින් වෙනුවෙන්ම වූ ටෙලි නාට්‍ය තුනක් නිෂ්පාදනය කරමින් අධ්‍යක්ෂණය කළ ලක්ෂ්මන් විජේසේකරයන්ගේ ගී එකතුවයි ''ලක්ෂ්මන් විජේසේකර එදා මෙදා තුර ගැයූ ප්‍රභාමත් ගී'' සංගත තැටිය. එහි ඇතුළත් ''ඇති දේ ඇති සැටියෙන්'' ගීතයයි මෙවර ''ගී සඳළුව'' සරසන ගීය. ගීයේ පද

රචනය වසන්ත කුමාර කොබවක ප්‍රවීණ ගී පද නිබන්ධකයාගෙන් වන අතර තණුව හා සංගීතය ආචාර්ය රෝහණ වීරසිංහයන්ගෙනි.

**ඇති දේ ඇති සැටියෙන් ලොව දකින මිනිස්සූ**
**ලද දේ සිත සතුටින් විඳ වෙසෙන මිනිස්සූ**
**පොරණේ මිහි සයනේ ගොඩ නැගුව මිනිස්සූ**
**කරුමය කිම වඳ වෙන ? ඉර සදිසි මිනිස්සූ**

**පොළවේ බිම අහසේ ඉම බෙදන ලෝකයේ**
**දහමේ ගුණ පත් ඉරු තුළ නිදන යාමයේ**
**ඉඳහිට හෝ සපැමිණ සිත් සතන් සැනැස්සූ**
**කරුමය කිම වඳ වෙන ? මල් සදිසි මිනිස්සූ**

**ඉතිරී ගිය ඉසුරින් නෙතු වැසුණ කාලයේ**
**පිරිහී දුක විඳිනා දන නොදුටු ලෝකයේ**
**සෙත් කවි සේ ළඟ සිට සිත් සතන් සැනැස්සූ**
**කරුමේ කිම වඳ වෙන ? සඳු සදිසි මිනිස්සූ**

**ගායනය: ලක්ෂමන් විජේසේකර**
**තනුව හා සංගීතය :ආචාර්ය රෝහණ වීරසිංහ**
**පද රචනය : වසන්ත කුමාර කොබවක**



දැන්වීම් අධ්‍යක්ෂකවරයෙකු ලෙස, රංගන ශිල්පියෙකු ලෙස, ටෙලි නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු ලෙස අප කවුරුත් දන්නා කලා කරුවකු වන විජේසේකරයන් වෘත්තියෙන් සංගීතාචාර්යවරයෙකි. රජයේ පාසල්වලට අමතරව නුගේගොඩ කලාභූමි කලායතනයේද ආචාර්යවරයෙකි ඔහු. පසුගිය වසරේ අගභාගයේදී මෙල්බන් නුවරදී පැවැත්වුණ ''ඔබ මට තරුවකි'' ගී ප්‍රසංගයට සහභාගී වීටම පැමිණි අවස්ථාවේ ''සන්නස'' මාසිකයේ ''ගී සඳළුව'' වෙනුවෙන් විජේසේකරයන්ගේ කාලය මොහාතක් වෙන් කර ගැනීමට අපි සමත් වූයෙමු.

''මම වඩා කැමති අධ්‍යක්ෂණයට'' ලක්මන් විජේසේකරයන් පිළිසඳරට යොමු වීය, අප සමගින්.

''විශේෂයෙන් තෝරලා බේරලා ගත්ත ගීත කීපයක් විතරයි සරළ ගී වැඩ සටහන්වලට කළේ. වැඩි හරියක් ටෙලි නාට්‍යවලට කරපු ගීත තමයි මට තියෙන්නේ. ඒ අතරින් සමහරක් ඒවා තේමා ගීත. ඉතින් මගේ සින්දු ගණන බැලුවොත් පනහක්වත් නැති තරම්. ''නිහතමානී ලෙස සිනහ වෙයි ඔහු.

''වෘත්තියෙනුත් සංගීත ගුරුවරයෙක් වුණ අපගේ මතකයයි. ඒ කොළඹ ජෝන් ද සිල්වා සමරු රඟහලේදීයි. ආචාර්ය රෝහණ වීරසිංහයන් සහ විශාරද ආනන්ද වීරසිරි සංගීතාචාර්යවරයාණන් සමග ලක්ෂ්මන් විජේසේකරයන් නුගේගොඩ ''කලාභූමි'' කලායතනය අරඹන්නට යෙදුනේ 1985 වසරේදීයි. එහි කළමණාකාරීත්වය පැවරුනේ සංගීත් නිපුන් මංජුලා සෙනෙවිරත්න සංගීතාචාර්යවරියටයි. ඊට විශාරද අමරසිරි පීරිස් සහ විශාරද නිර්මලා රණතුංග යන සංගීත ශිල්පීහු පිළිවෙලින් වයලීනය සහ ගායනය ඉගැන්වීමට විටින් විට දායක වූහ. මෙල්බන් රසිකයින් වෙනුවෙන් ලක්ෂ්මන් විජේසේකරයන්ට පැවසීමට ඇත්තේ මොනවාදැයි දැන ගැනීමට අපි උනන්දු වූයෙමු.

''මම මේලබන් නුවරට ආව පස්වෙනි වතාවයි මේ. ඒ ආව හැම වාරයකම ප්‍රසංග සාර්ථක වුණා. ඒ කියන්නේ මෙහේ ඉන්න අපේ රසිකයින්ගේ ප්‍රතිචාර ඉහළයි කියන එකනේ. ඉතින් මට ඒ හැමෝවම ආදරයෙන් ස්තුතිපූර්වකව සිහිපත් කරනවා. මේ වාරයේ ඇවිත් මෙල්බන් මුතුහර ළමා සමාජයේ වැඩ මුළුවකටත් සහභාගී වුණා. ගීත දෙකකුත් ළමයින්ට ඉගැන්වූවා. ඒ සංවිධාන කටයුතුවලටත් අපිට ආරාධනා කිරීම වෙනුවෙන් වත්සලා ඉෂ්ඨවීර මහත්මියට සතුති කරන්න ඕනෙ. මොකද ඒ අය හැමෝම

ACCOUNTING TUTORING
VCE/TAFE/UNI

- Individual classes
- Small group classes
- Any accounting subject
- Flexible time and home visits
- Reasonable rates
- Based in Dandenong

*Popular tutor and former government school teacher in Sri Lanka.*

Rushan Silva
MBA/MPA (Deakin)
B.Sc (B.Adm) sp.

Contact : 0430297807 E-mail : maths4kids@outlook.com